SINHALESE

## එසේනම් මගේ සහකරු/සහකාරිය පරීක්ෂණයකට ලක් කිරීම වැදගත්ද?

ඔව්. ඔබ ළමුන් බිහි කිරීමට සැලසුම් කරන්නේ නම් මෙය ඉතා වැදගත්ය.

## මගේ පවුලේ අනික් සාමාජිකයන් තැලසීමියාව පිලිබඳ පරීක්ෂණයකට ලක් කල යුතුද?

ඔව්. ඔබේ සමහරක් ළමුන්ට තැලසීමියාව තිබිය හැකි බැවින් ඔවුන්ව ඒ ගැන පරීක්ෂණයකට ලක් කල යුතුය. විශේෂයෙන්ම ඔවුන් ළමයින් බිහි කිරීමට සැලසුම් කරන්නේ නම්, ඔබේ සහෝදර සහෝදරියන්ද පරීක්ෂණයකට ලක් කල යුතුය.

## ඔවුන්ව පරීක්ෂණයකට ලක් කල හැක්කේ කොතැනදීද?

තැලසීමියාව සඳහා රුධිර පරීක්ෂණයක් ඔබේ පවුලේ වෛද්‍යවරයා මගින් සුදානම් කරගත හැක.



## මට තැලසීමියාව ගැන වැඩිදුර සොයාගත හැක්කේ කෙසේද?

තැලසීමියාව ගැන වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර අමතන්න:

**Thalassaemia Australia Inc.**
333 Waverley Road, Mt Waverley VIC 3149
දුරකථනය: 03 9888 2211
ඊමේල්: info@thalassaemia.org.au
වෙබ් අඩවිය: www.thalassaemia.org.au

**Thalassaemia Services Victoria**
Medical Therapy Unit, Monash Medical Centre
246 Clayton Road, Clayton VIC 3168
දුරකථනය: 03 9594 2756

**Mercy Hospital for Women**
Genetics
163 Studley Road, Heidelberg VIC 3084
දුරකථනය: 03 8458 4250

**Royal Women's Hospital**
Thalassaemia Clinic
Cnr Grattan Street and Flemington Road, Parkville VIC 3052
දුරකථනය: 03 9342 7000 Fax: 03 9342 7802

**නිව් සවුත් වේල්ස්හි අමතන්න:**

**Thalassaemia Society of NSW**
Level 7, King George V Building,
Missenden Road, Camperdown 2050
PO Box M120 Camperdown NSW 2050
දුරකථනය: 02 9550 4844 Fax: 02 9519 3517
ඊමේල්: coordinator@thalnsw.org.au

LORD MAYOR'S CHARITABLE FOUNDATION

නගරාධිපති තුමාගේ පුණ්‍යාධාර පදනම විසින් සාඩම්බරයෙන් අනුග්‍රහය දක්වන ලදී

November 2011



# ඔබට බීටා සුළු තැලසීමියා තිබේ නම්...

## ඔබට සහ ඔබේ පවුලට වැදගත් තොරතුරු

# තැලසීමියාව යනු කුමක්ද?

තැලසීමියාව යනු රතු රුධිර සෛල වල ඔක්සිජන් ගෙනයන කොටස වන හීමෝග්ලොබින් නිෂ්පාදනයට බලපාන ආවේනික අබාධයකි. මෙය දෙආකාරයකට මතුවේ - සුළු තැලසීමියාව (විෂම ජාන සෛල ආකාරයේ වාහක ) සහ මහ තැලසීමියාව (සමජාතිය ජාන සෛල ආකාරය)

# මට මෙය හැදුනේ කෙසේද?

ඔබට එය උරුමයෙන් ලැබුනි : එනම් ඔබේ දෙමාපියන්ගෙන් එක් කෙනෙකුගෙන් ඔබට එය ලැබුනි.

# මට මෙය සැමදාම පවතීද?

ඔව්. ඔබ සුළු තැලසීමියාව සහිතව උපත ලබා ඇති අතර ඔබට එය සැමදා පවතිනු ඇත. එය ඔබෙන් ඉවත් වන්නේ හෝ මහ තැලසීමියාව බවට හැරෙන්නේ හෝ වෙනත් ආබාධයකට හැරෙන්නේ නැත.
එය බෝවෙන්නේ නැත.

# මගේ සෞඛ්‍යයට එය බලපායිද?

නැත. සුළු තැලසීමියාව රෝගවාහක අවධියක් වන අතර එය වාහකයාගේ සෞඛ්‍යයට තදබල ලෙස බලපාන්නේ නැත. මේ සඳහා ප්‍රතිකාර අවශ්‍ය නැත. එනමුත් ඔබ  වෛද්‍යවරයකු හමුවීමට ගිය සැමවිටම ඔබට සුළු තැලසීමියාව තිබෙන බව පැවසිය යුතුය. එවිට අනවශ්‍ය රුධිර පරීක්‍ෂණ සහ ප්‍රතිකාර ඔබට ලබාදීම වැලකෙනු ඇත.

# සුළු තැලසීමියාව මගේ සෞඛ්‍යයට බලපාන්නේ නැතිනම් ගැටලුව කුමක්ද?

ගැටලුව නම්  ඔබට සහ ඔබේ සහකරුට/සහකාරියට සුළු තැලසීමියාව තිබේනම්, ඔබේ ළමයි මහ තැලසීමියාව සහිතව ඉපදීමට පුලුවන් වීමයි.

# මහ තැලසීමියාව යනු කුමක්ද?

මහ තැලසීමියාව යනු උග්‍ර නීරක්තිය ඇතිකරන ආබාධයකි.

මහ තැලසීමියාව තිබෙන අයට නිතිපතා රුධිර පාරවියලනය සහ දිනපතා බෙහෙත් ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය වේ. ප්‍රතිකාර නොලද්දේ නම්  මොවුන් නීරක්තියේ ප්‍රතිඵලයක් ලෙස තම ජීවිතයේ පළමු අවුරුදු කීපය ඇතුලත මියයනු ඇත.

# තැලසීමියාව සමහරක් ජන වාර්ගික කණ්ඩායම් අතර අනෙක් ජන වාර්ගික කණ්ඩායම් අතරට  වඩා බහුලද?

තැලසීමියාව ඕනෑම ජනවර්ගයක කෙනෙකුට ඇතිවීමට පුලුවන්  නමුත්, මෙය සයිප්‍රසය, ග්‍රීසිය, ඉතාලිය, තුර්කිය, මෝල්ටාව සහ ඊජිප්තුව යන මධ්‍යධරණීය රටවල අය අතර වඩා බහුලය. මැද පෙරදිග, ඉන්දියානු උප මහාද්වීපය, අග්නිදිග ආසියාව සහ දකුණු චීනයේ අය අතරද මෙය බහුලය.

ඔස්ට්‍රේලියාවේ සුළු තැලසීමියාව බහුලය.

# තැලසීමියාව මෙම ජන වාර්ගික කණ්ඩායම් අතර වඩා බහුල මන්ද?

මීට හේතුව මුලමනින්ම පැහැදිලි නැති නමුත් ඉහත රටවල බහුලව තිබුනු මැලේරියාවෙන් ආරක්‍ෂක  බලපෑමක් තැලසීමියාවට තිබුනා වියහැක.

# මගේ ළමයින්ට  මෙයින් බලපෑමක් තිබේද?

ළමයින්ට මෙය බලපාන ආකාරය දෙමාපියන්ගෙන් එක්කෙනෙකුට හෝ දෙදෙනාටම සුළු තැලසීමියාව තිබේද යන්න මත රඳා පවතී.




### (a) එක් සහකරුවකුට පමනක් සුළු තැලසීමියාව තිබේ නම්

සෑම ගැබ් දැරීමකටම ඔබට සුළු තැලසීමියාව සහිත ළමයෙක් ලැබීමට 50%ක සම්භාවිතාවක්ද, තැලසීමියාව රහිත  ළමයෙක් ලැබීමට 50%ක සම්භාවිතාවක්ද තිබේ.

ඔබට මහ තැලසීමියාව සහිත ළමයෙක් ලැබීමේ අවදානමක් නැත.

### (b) දෙමාපිය දෙදෙනාටම සුළු තැලසීමියාව තිබේ නම්

සෑම ගැබ් දැරීමකටම ඔබට මහ තැලසීමියාව සහිත ළමයෙක් ලැබීමට 25%ක සම්භාවිතාවක් ඇත.

එමෙන්ම තැලසීමියාව රහිත ළමයෙක් ලැබීමට 25%ක සම්භාවිතාවක්ද, සුළු තැලසීමියාව සහිත ළමයෙක් ලැබීමට 50%ක සම්භාවිතාවක්ද තිබේ.




දෙමාපිය දෙදෙනාටම සුළු තැලසීමියාව තිබෙන අතර  ළමුන් බිහි කිරීමට සැලසුම් කරන්නෙහිනම් ඔබට විකල්ප රැසක් ඇති බැවින් මෙම විකල්ප ගැන ඔබ අදාල වෛද්‍ය වෘත්තිකයන් සමග සාකච්ජා කිරීම වැදගත්ය.